# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2354/05 - 2023 ඔක්තෝබර් මස 16 වැනි සඳුදා - 2023.10.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු ආඥාපනත යටතේ නිවේදනයයි

(ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 04/2023)

(235 වැනි අධිකාරිය) වන රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව, 2023 ඔක්තෝබර් මස 04 වැනි දින පවත්වන ලද ප්‍රසිද්ධ සභා වාරයේ දී පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ආර්. එම්. පී. රත්නායක,**
*වැඩ බලන ලේකම්,*
මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

2023 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ හා
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**යෝජනාව**

මෙම යෝජනාව *ගැසට්* පත්‍රයෙහි නිවේදනය කරනු ලබන දිනයෙහි සිට (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ ''අ'' උපලේඛනයේ විධිවිධාන යටතේ වූ 2023 මාර්තු මස 24 දිනැති අංක 2324/49 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයේ ඇමුණුම 1හි අනුග්‍රහ ලැයිස්තුව (ආනයන) සඳහා, මෙහි වූ අංක 5 වශයෙන් සඳහන් නව අයිතමය ඇතුළත් කිරීමට, (235 වැනි අධිකාරය) වන රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

1A - G 40558 — 41 (2023/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *අයිතමය* *(1)* | *විස්තරය* *(2)* | *තීරු ගාස්තු ප්‍රමාණය* *(3)* |
|---|---|---|
| 05. | මුද්‍රණ තීන්ත නිෂ්පාදන කාර්යය සඳහා ලියාපදිංචි මුද්‍රණ තීන්ත නිෂ්පාදකයන් විසින් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 3903.90.10 යටතේ වර්ගීකරණය වන ජලමූල සමජාතීය අවයවික (හෝමො පොලිමර්) සහ බහුඅවයවික (කොපොලිමර්) සහ 3906.90.10 යටතේ වර්ගීකරණය වන ජලමූල ඇක්‍රිලික් සමජාතීය අවයවික (හෝමො පොලිමර්) සහ බහුඅවයවික (කොපොලිමර්) ආනයනය කිරීම, කර්මාන්ත විෂයභාර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත, සහ රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව | 5% |

EOG 10 - 0208

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.